*සැ. යු.* - 2023.06.09 දින පළ කරන ලද අංක 2336 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,337 - 2023 ජුනි මස 16 වැනි සිකුරාදා - 2023.06.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 384 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 387 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජූලි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

383- B 082464 — 353 (2023/06)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය.

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් අන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
අංක 236, ගාලු පාර, කොළඹ 03.

නඩු අංකය : CHC 10/2019 MR
ඇස්කිසි අංකය : 24/2022

...............*පැමිණිලිකරු.*

*එදිරිව*

1. කුරුප්පු ආරච්චිගේ සාලිය සුභාෂණ, අංක 05, වරකාපොල පාර, මීරිගම.

2. කලව්ටිගොඩ පතිරන්නැහැලාගේ රේණුකා ජයන්ත පතිරත්න, අංක 05, වරකාපොල පාර, තවලම්පිටිය, මීරිගම. දැනට අංක 05, වරකාපොල පාර, මීරිගම.

3. දඩැල්ලගේ සචිත්‍රා හංසිනී ද සිල්වා, අංක 43, ස්වර්ණ ජයන්ති හරස් පාර, වලව්වත්ත, මීරිගම.

................*විත්තිකරුවන්.*

ඉහත නම් සඳහන් 3 වන විත්තිකරු වෙතය.

මෙම නඩුවෙ හි වර්ෂ 2021 ක්වූ නොවැම්බර් මස 17 වැනි දින ඇතුලත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාර ව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි මෙම නඩුවෙ හි 1 වන සහ 3 වන විත්තිකරුවන්ට විරුද්ධව,

රු. 380,752.21 ක මුදලක් සහ 2017.11.01 වැනි දින සිට පැමිණිල්ලේ දින දක්වා එවකට පැවති පොළී අනුපාතය වන 4%ක මාසික පොළී අනුපාතිකයට අදාළව ගණනය කළ පොළියක් ද, ඉන්පසු පැමිණිල්ලේ දින සිට එකී සම්පූර්ණ මුදල් ගෙවා නිම කරන තෙක් නෛතික පොළිය ගෙවීමටත්, ගිවිසුමේ උපලේඛනයේ මෙන්ම පහත උපලේඛනයේ විස්තර වන KOBELCO 135-SR දරන EXCAVATOR යන්ත්‍රය යහපත් හා මනා ක්‍රියාකාරිත්වයෙන් පැමිණිලිකරු වෙත ලබාදීමටත්, රු. 4,756,922.90 ක මුදලක් අලාභ ලෙස ගෙවීමට ද, වර්ෂ 2017 ක්වූ නොවැම්බර් මස 01 වැනි දින සිට පැමිණිල්ලේ දින දක්වා එවකට පැවති පොළී අනුපාතය වන 4%ක මාසික පොළී අනුපාතිකයට අදාළව ගණනය කළ පොළියක් ගෙවීමට නියෝග කරන ලෙස ද, ඉන්පසු පැමිණිල්ලේ දින සිට එකී මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් නෛතික පොළිය ගෙවීමටත්, බද්ද අවසන් කරන ලද වර්ෂ 2017 ක්වූ නොවැම්බර් මස 01 වැනි දිනෙන් පසුව, වෙනත් වියදම් සඳහා වූ රු. 13,493/- ක මුදලක් ද, රක්ෂණ වියදම් සඳහා වූ රු. 56,232.54 ක මුදලක් ද, එකී මුදල් මත ගිවිසුම යටතේ බද්දට දීම අවසන් කරන ලද වර්ෂ 2017 ක්වූ නොවැම්බර් මස 01 වැනි දින සිට පැමිණිල්ලේ දින තෙක් එවකට පැවති පොළී අනුපාතය වන මසකට 4%ක මාසික පොළී අනුපාතිකයට අදාළව ගණනය කළ පොළියක් අයකර ගැනීමටත්, ඉන්පසු එකී මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන්වන තෙක් පැමිණිල්ලේ දින සිට නෛතික පොළිය ගෙවීමටත්, නඩු ගාස්තු සහ ගරු අධිකරණයට සුදුසු යයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ලබාදෙන ලෙසත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කරන ලදී.

සියලුම අයකිරීම් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 02ක් තුළ දී හෝ එකී තීන්දු ප්‍රකාශයේ අධිකරණය විසින් නියම කරන ඊට වඩා දීර්ඝ කාලයක දී ගෙවීම පැහැර හරින්නේ නම් මෙහි පහත උපලේඛනයේ විස්තර වන 3 වන විත්තිකාරියට අයත් වර්ෂ 2020 ක්වූ ජුනි මස 17 වැනි දින ප්‍රසිද්ධ නොතාරිස් රවින්දන කුරුප්පු විසින් ලියා සහතික කරන ලද අංක 4218 දරන සුරකුමක් ලෙස තබා ඇති එකී ඉඩම හා ඊට අදළ දේපළ අධිකරණය විසින් පත් කරන බලයලත් වෙන්දේසිකරුවකු ලවා අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙස ආඥා කරනු ලැබ ඇති බැවින් ද,

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව 1 වන සහ 3 වන විත්තිකරුවන් විසින් ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ ආදී සියලු දේ,

**වර්ෂ 2023ක් වූ ජූලි මස 18 වැනි දින ප. ව. 1.00ට,**

එකී දේපළ පිහිටා ඇති බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඹගහවත්ත ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළ ම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

(i) මුල් ගැණුම් මිලෙන් 25%ක මුදලක් ද,
(ii) තක්සේරු ගාස්තුව 0.5% ක් ද,
(iii) වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,
(iv) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාර පිස්කල් ගාස්තු,
(v) විකිණීම සඳහාවන සියලුම ගාස්තු.

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදළ මුදල, මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය.

චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25%ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදලවන 75% ක මුදල දින 30ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම කෝරලේ, යටිගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා බලසීමාව තුළ සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 40සී, තිළිණගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අම්බන යන ගම පිහිටි අම්බනවත්ත කියන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයපාල විසින් මැන සාදන ලද අංක 2710 සහ 2018.10.11 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 376ඒ දරන කොටසට මායිම් :- උතුරට : කැබලි අංක 377 සහ කැබලි අංක 349 (පාර) ද, නැගෙනහිරට : කැබලි අංක 349 සහ 338 ද, දකුණට : කැබලි අංක 338 සහ කැබලි අංක 375 ද සහ බස්නාහිරට : කැබලි අංක 375, 379 සහ 377 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනමයයි දශම දෙකයි දෙක (පර්. 19.22) විශාල ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදි සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 353/103 හි ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.-*

මීරිගම ඩී. එස්. සේනානායක විදුහල පිටුපසින් වැටී ඇති පාරේ මීටර් 50ක් පමණ දුරින් වමට යනවිට පාරේ ඉදිරියට ගිය විට එම පාරේ අවසානයේ හමුවන වම් පස පිහිටි ඉඩම.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2023 ක් වූ මැයි මස 16 වැනි දින දී ය.

06-249

---

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

හැටන් දිසා අධිකරණයේ දී ය

කොළඹ 01, සර් රසීක් ෆරීඩ් මාවත, අංක 21 දරන ස්ථානයේ,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

*.................පැමිණිලිකරු.*

නඩු අංකය : MB/77/15
වටිනාකම : රු. 2,765,451.63
ස්වභාවය : උකස්
කාර්ය පටිපාටිය : සාමාන්‍යය

*එදිරිව*

සෙල්වපෙරුමාල් දිවාස්කර්,
නිව් අද්දිපරශක්ති ඉල්ලම්,
ග්‍රීන් ලෑන්ඩ් ෆාම්,
අප්කොට්.

*.....................විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 14 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි පැමිණිල්ලේ සඳහන් පළමුවන නඩු නිමිත්ත මත (අ) ඉහත කී පළමුවන නඩු නිමිත්ත මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් 1,102,979.00ක මුදල සහ එකී මුදල මත 2014 සැප්තැම්බර් 24 දක්වා පොළිය වශයෙන් රුපියල් 386,880.41 ක මුදලක් සහ එකී මුල් මුදල වන රුපියල් 1,102,979/- ක මුදල මත 2014 සැප්තැම්බර් මස 25 දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිමකරන තෙක් වර්ෂයකට 16% බැගින් වැඩිදුර පොළිය ද සමග විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශකර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ ආයාචනයේ (ආ) ඡේදයේ අයැද ඇති පරිදි පැමිණිල්ලේ සඳහන් දෙවන නඩු නිමිත්ත මත 2014 සැප්තැම්බර් 24 වැනි දිනට පොළිය ද ඇතුළත්ව අයිරාගත ශේෂය වන රු. 1,275,592.22 මුදල සහ 2014 සැප්තැම්බර් 25 දින සිට එකී අයිරාගත ශේෂය සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් වර්ෂයකට 24% බැගින් වැඩිදුර පොළිය ද සමග විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශකර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ ආයාචනයේ (ඇ) ඡේදයේ අයැද ඇති පරිදි විත්තිකරු විසින් පැමිණිලිකරුට මෙම නඩුවේ තක්සේරු නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශකර ඇති හෙයින් ද,

මා වෙත නිකුත් කරන ලද විකිණීමේ අධිකාරි පත්‍රයේ බලය පිට විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නඩුවට අදාළ උකස් දේපළ, **වර්ෂ 2023ක් වූ ජූලි මස 27 වැනි දින ප. ව. 1.00ට එකී දේපළ** පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.-*

මස්කෙළිය නගරයේ සිට අප්කොට් පාර ඔස්සේ ගවර්විල්ලා පාසැල් හංදියේ අංක 9/5 දරන බෝක්කුව දක්වා කිලෝමීටර් අටක් පමණ ගමන්කර එතැනින් ස්ටොක්හෝම් වතුයාය පාරට දකුණට හැරී ගවර්විල්ලා දෙමළ පාසල් පරිශ්‍රය පාර දක්වා මීටර් 20ක් පමණ ගමන් කර අනතුරුව ග්‍රීන්ලන්ඩ් ෆාම් පාර සිට ප්‍රවේශය ඇති තේ ක්ෂේත්‍රයට මායිම් වන පාසල් පරිශ්‍රයේ සිට මීටර් 500ක් පමණ ඇතින් පිහිටි අදාළ දේපළ වෙත ළඟාවීමට පාසල් පාරට වමට හැරී ග්‍රීන් ලන්ඩ් ෆාම් නේවාසික ප්‍රදේශය දක්වා පාසල් පරිශ්‍රය හරහා කෙළින් ඉදිරියට ගමන් කරන්න.

*ගෙවීම් ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහ (25%) ක් දේපළ මිළදී ගත් වහාම ගෙවිය යුතු වන අතර ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/-ක ගාස්තුවක් ද රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000/-ක් සඳහා ම රු. 5/- බැගින් කණු ගාස්තු ගෙවිය යුතුය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, උඩ බුලත්ගම කොට්ඨාසය තුළ අඹගමුව කෝරළයේ, අප්කොට් ග්‍රාමයේ පිහිටි ආර්. කනගරත්නම් මානකතැනගේ අංක 6269 දරන 1995 ජූලි 2 දිනැති සැලැස්මේ නිරූපිත ඉඩමේ කොටසක් වන (මෙම ඉඩම ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන මානකතැනගේ අංක 1616 දරන 1960-5-21 දිනැති සැලැස්මේ කැබලි අංක 01 හි කොටසක් වන එය ගවර්විල්ලා වත්තේ බැග්‍රෝව් කොටසේ 1A දරන ක්ෂේත්‍රයේ කොටසක් ද වේ.) ආර්. කනගරත්නම් මානක තැනගේ අංක 6399 දරන 1995 නොවැම්බර් 26 දිනැති සැලැස්මේ නිරූපිත බිම් කොටස සඳහා මායිම්, උතුරු - නැගෙනහිර ආර්. කනගරත්නම්ගේ අංක 6325 දරන 1995.09.14 සහ 15 දින දරන සැලැස්මේ ලොට් 1A බිම් කැබැල්ල දකුණු - නැගෙනහිරට එකී අංක 6325 සැලැස්මේ ලොට් 3 දරන බිම් කැබැල්ල දකුණු - බටහිර ගවර්විල්ලා වතුයාය උතුරු - බටහිරට එකී ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි එකී අංක 6399 දරන සැලැස්ම අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20) හෝ හෙක්ටයාර 0.0506ක් ඒ මත පිහිටි වරිපනම් අංක 5 මහවීදිය අප්කොට් යන ගොඩනැගිල්ල සහ ඒ මත පිහිටි සියලු දෑ ඇතුළත් වේ. එකී ඉඩම ගම්පොල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී කොට්ඨාසයේ 87/36 වෙළුමේ/පත්‍රිරුවෙ හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම සුමංගලී සුබ්‍රමානියම් බලයලත් මානක තැන විසින් නැවත මැන පහත පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලයේ, අඹගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ අප්කොට් ග්‍රාමයේ පිහිටි සුමංගලී සුබ්‍රමානියම් මානක තැනගේ අංක 1627A/2011 දරන 2011 මැයි 18 දිනැති සැලැස්මේ නිරූපිත ලොට් 1 ඉඩම (මෙම ඉඩම ආර්. කනගරත්නම් මානක තැනගේ අංක 6399 දරන 1995 නොවැම්බර් 26 දිනැති සැලැස්මේ නිරූපිත බිම් කොටසේ නැවත මැනීමකි.)

සඳහා මායිම් ඃ උතුරු - නැගෙනහිර ඃ ආර්. කනගරත්නම්ගේ අංක 6325 දරන 1995.09.14 සහ 15 දින දරන සැලැස්මේ ලොට් 1A බිම් කැබැල්ල ; දකුණු - නැගෙනහිරට ඃ එකී අංක 6325 සැලැස්මේ ලොට් 3 දරන බිම් කැබැල්ල ; දකුණු - බටහිර ඃ ගවර්විල්ලා වතුයාය, උතුරු - බටහිරට ඃ එකී ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි එකී අංක 6399 දරන සැලැස්ම අනුව ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (පර්. 20) හෝ හෙක්ටයාර් 0.0506ක් ඒ මත පිහිටි වරිපනම් අංක 5 මහවීදිය අප්කොට් යන ගොඩනැගිල්ල සහ ඒ මත පිහිටි සියලු දෑ ඇතුළත් වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
හැටන්.

06-334

---

## විවිධ දැන්වීම්

### ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

කොළඹ 08, කින්සි පාර, අංක 148/1 හි පිහිටි මීරිගම ඩෙන්ඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධ කාරණාවේ දී ය.

ගණන් බේරා වසා දැමීමේ
ඉල්ලීම් අංක : 35/2023/CO

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ගණන් බේරා වසාදැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5,
ගාලු පාර,
කොළඹ 03.

*...................පෙත්සම්කරු.*

කොළඹ දී නඩු විභාග කරන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා,

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර, කොළඹ 03.

විසින් 2023 මැයි මස 22 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම **2023 ජූලි මස 24 වැනි දින** එකී අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කර ඇති බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීමට සහයෝගය හෝ විරෝධය හෝ දැක්වීමට කැමති එකී සමාගමේ යම් ණයහිමියෙකු හෝ දයකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥ මහතෙකු හෝ ලේඛනගත නීතිඥයෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බව මෙයින් දන්වනු ලැබේ. තව ද, පෙත්සමේ පිටපතක් ඒ සඳහා නියමකර ඇති ගාස්තු ගෙවීම මත එය අවශ්‍යවන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දයකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ තේජක පෙරේරා,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

*සටහන.-*

එකී පෙත්සම ඇසීමේ දී පෙනී සිටීමට අදහස් කරන යම් පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති ඔහුගේ/ඇයගේ/එහි අදහස, ඉහත නම සඳහන් නීතිඥ තේජක පෙරේරා යන අය වෙත ලිඛිතව භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතු ය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනය හෝ යම් ව්‍යාපාරයක් නම් එහි නම සහ ලිපිනය හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛනගත නීතිඥයින් ඇත්නම් ලේඛනගත නීතිඥවරයාගේ නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍යවන අතර, **එය 2023 ජූලි මස 22 වැනි දින පස්වරු 1.00ට** පෙර ඉහත නම සඳහන් අයවලුන්ට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර කිරීම හෝ තැපැල් කරනුයේ නම්, එසේ තැපැල් කිරීම අවශ්‍ය වේ.

නීතිඥ තේජක පෙරේරා,
පෙත්සම්කරුගේ නීතිඥ.

06-317

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

*නඩු අංකය :* CHC/32/2023/CO

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටසේ ප්‍රතිපාදන ප්‍රකාරව සහ ඒ යටතේ පැලියගොඩ, නව නුගේ පාරේ, අංක 81/4 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන මග නැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඉක්විප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහාවන ඉල්ලීම පිළිබඳව වන කාරණයේ දී ය.

ටූ කේ කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 58/1, විශාඛා පෙදෙස, ගම්පහ.

*...................පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2023ක් වූ මැයි මස 02 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ පුනර්ජී කරුණාසේකර ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම **2023/09/14 වැනි දින** අධිකරණය ඉදිරියේ විභාග කරනු ලැබීමට නියමකර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීම හෝ විරුද්ධ වීමට කැමති එකී සමාගමේ ණයහිමියකු හෝ දායකයකු වේ නම් ඒ තැනැත්තා කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවේ එය පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ දායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පුනර්ජී කරුණාසේකර,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 03, අපොන්සෝ ඇවනිව්,
කොළඹ 03.

*සටහන.-*

එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ පෙනී සිටීමට කැමැති ඕනෑම තැනැත්තකු තමා විසින් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ පුනර්ජී කරුණාසේකර වෙත භාර දිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමේ එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම, ලිපිනය සඳහන් කළ යුතු අතර එය එකී තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයකු වෙතොත් එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම **2023.09.13 වැනි දින සවස 6.00ට** පෙර ලැබෙන්නට භාර දිය යුතුය.

රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

2023 මැයි මස 26 වැනි දින.

06-314

---

**මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාපනය කිරීම සඳහා වූ පනතකි**

හේරත් මුදියන්සේලාගේ සමන්ප්‍රිය හේරත් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝග යටතේ "මහවිලච්චිය ළමා අධ්‍යාපන මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී මධ්‍යස්ථානය සංස්ථාගත කිරීමයි :-

(1) අරමුණු සහ අනාගත රැකියා අවස්ථාවලට මුහුණ දීමට යෞවන යෞවනියන් වඩාත් හොඳින් සූදනම් කිරීමට ඉගෙනීම් සහ නිපුනතා වර්ධන වැඩසටහන් මෙහෙයවීම,

(2) තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම,

(3) දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන යෞවන යෞවනියන් සඳහා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවාවන් ලබාදීම සහ/හෝ පිළියෙල කිරීම,

(4) නිපුණතා සහ ඉගෙනීම වර්ධනය කිරීමට කළින් කළට අවශ්‍ය වැඩසටහන් මෙහෙයවීම.

හේරත් මුදියන්සේලාගේ සමන්ප්‍රිය හේරත්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

06-311

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.